# ධර්මපාලතුමා නැති ගම්පෙරළිය

මවුපියන්ගේ අවශ්‍යතාව පරිදි පිනදාස හා සමග විවාහ වුව ද නන්දාට මුල දී අවශ්‍ය වුයේ පියල් හා සමග විවාහ වීමට බව පැහැදිලි ය. එහෙත් නන්දා පිනදාස හා සමග විවාහ වීමෙන් පසුව පියල් හිතින් අත්හැර තම සැමියා හා සමගින් ජීවත් වුවා ය. එසේ වුව ද පිනදාස බටහිරයන් විසින් ඇති කෙරෙමින් තිබූ ප්‍රභූ සමාජයට සුදුසු පුද්ගලයෙක් නො වී ය. ඔහු සිංහලේ ගොස් අසාර්ථක විය. ඔහුට නන්දාගේ ප්‍රභූ සමාජයට වත් මුහුණ දීමට නොහැකි විය. නන්දාට දැනගන්නට ලැබුණේ ඔහු මිය ගිය බව ය. කෙසේ වෙතත් ඔහු සමාජයීය අර්ථයෙන් මියගිය පුද්ගලයෙක් විය. නන්දා ඉන්පසු පියල් සමග විවාහ වී කලක් ගතවීමෙන් පසුව පිනදාස ශාරරික ව මිය ගියේ ය. පියල් නන්දා සමගින් ප්‍රභූ සමාජයේ ඊළඟ කඩඉම පනින්නේ ගම අත්හැර කොළඹ පදිංචියට ඒමෙන් ය.

බ්‍රිතානීන් විසින් මෙන් ම එයට පෙර ලන්දේසීන් විසින් ද කොළඹ වෙළෙඳ මධ්‍යස්ථානයක් ලෙස මෙන් ම සංස්කෘතික මධ්‍යස්ථානයක් ලෙස ද හඳුනාගනු ලැබ තිබුණි. කොළඹ බටහිරයන්ගේ නගරයක් විය. අනුරාධපුරය ද නගරයක් වූ නමුත් ඒ සිංහල සංස්කෘතියෙහි බිහි වූ නගරයක් විය. අනුරාධපුර හා ගම් අතර තිබුණේ සංස්කෘතික බැඳීමකි. ඒ සංස්කෘතික බැඳීම කොළඹ හා බ්‍රිතානීන්ගේ සමයේ ලංකාවේ ගම් අතර නො වී ය. එවැනි සංස්කෘතික බැඳීමක් තිබුණේ කොළඹ හා ගම්වල ප්‍රභූ පවුල් අතර ය. කොළඹ හා ලංකාවේ ගම් අතර සංස්කෘතික බැඳීමක් ඇති වීම ආරම්භ වුයේ ඒ ඒ ප්‍රදේශවල මධ්‍යම මහා විද්‍යාල ඇතිවීමෙන් පසුව ය. ඒ බැඳීම වර්ධනය වුයේ රූපවාහිනියේ සම්ප්‍රාප්තියෙන් පසුව ය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ගම් පෙරළියෙහි නිර්මාණය කළ ගම ප්‍රභූ ගමක් බව කලින් සඳහන් කෙර ඇත. මේ ප්‍රභූවරු සාමාන්‍ය ජනයාගෙන් මුළුමනින් ම ඉවත් වූ පිරිසක් නො වූ හ. ගමෙහි අනෙක් අය සමග ඔවුහු සම්බන්ධකම් පැවැත්වූ හ. ගමෙහි අනෙක් මිනිස්සු කයිසාරුවත්තේ මුහන්දිරම්ගේ නිවසට ආගන්තුකයෝ නො වුණ හ. එහෙත් ඒ වන විටත් මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර ආකල්ප ගැමි ප්‍රභූන්ගේ ඔළුවලට ව්‍යාජ ව දමා ඇති බවක් ද පෙනෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා ගම්පෙරළිය නිර්මාණය කර ඇත්තේ හුදු ආර්ථික පරිසරයක ය. ආර්ථික අත්තිවාරම විසින් සංස්කෘතිය නිර්ණය කෙරෙන්නේ ය යන මාක්ස්වාදී ස්ථාවරය මෙහි දී වික්‍රමසිංහ මහතා අවිඥානික ව දැරූ බව පෙනෙන්නට ඇත. වික්‍රමසිංහ මහතා ගමෙහි හා රටෙහි වූ සංස්කෘතික මූලය බටහිරයන්ගේ ආර්ථික මූලයට හිලවු කර ඇත.

විසිවැනි සියවසේ මුල් දශක කිහිපය අයත් වුයේ මෙරට බෞද්ධ පුනර්ජීවනය ක්‍රියාත්මක වූ යුගයට ය. බටහිරයන් විසින් ඇති කරනු ලැබූ පවුල්වලට ද බෞද්ධ පුනර්ජීවනය ලෙස හඳුන්වනු ලැබූ ප්‍රපංචයෙන් බැහැර වීමට නොහැකි විය. එහෙත් ගම්පෙරළියෙහි අපට ඒ පිළිබඳව කිසිවක් දැනගත නො හැකි ය. අනගාරික ධර්මපාලතුමා විසින් නායකත්වය දෙන ලද බටහිර සංස්කෘතික යටත් විජිත විරෝධී සටන ගම්පෙරළියෙන් ගිලිහී ගොස් ය. ගම්පෙරළියෙහි දැක්වෙන ප්‍රධාන ප්‍රභූ පවුල හා ගමේ පන්සල අතර සම්බන්ධයක් නැත. ඒ පවුල, බලදාස ආදීන් හා පියල් පන්සල් ගමනක් යන්නේ ගමෙන් පිට පන්සලක් වූ පරගොඩ විහාරයට ය. ඒ ගමන වන්දනා ගමනකට වඩා ප්‍රභූ තරුණ තරුණියන්ගේ විනෝද ගමනක් විය.

මාර්ටින් වික්‍රමසිංහ මහතා ධර්මපාලතුමාගේ ව්‍යාපාරය වුවමනාවෙන් ම අත්හැරියේ ද, එසේත් නැත්නම් තමා නිර්මාණය කළ ප්‍රභූ ගම්පෙරළියෙහි ධර්මපාලතුමාගේ ව්‍යාපාරයට වැදගත්කමක් නැතැයි සිතුවේ ද? මාර්ටින් වික්‍රමසිංහ මහතා මාක්ස්වාදියකු නො වුව ද ජනප්‍රිය මාක්ස්වාදී අදහස් මත පිහිටා ගම්පෙරළිය නිර්මාණය කර ඇත. ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතාගේ රේඛාව චිත්‍රපටියෙහි පන්සලක් නැති ගමක් නිරූපණය වෙයි. ගම්පෙරළියෙහි ද පරගොඩ විහාරය හැරෙන්නට පන්සලක් නැත.

කතාවට අදාළ නැත්නම් නවකතාවකට හෝ සිනමාවට හෝ පන්සලක් අවශ්‍ය නො වේ යැයි මෙරට සිටින පඬිවරුන් හා පඬිවරියන් කියන්නට පුළුවන. ඒ බව සැබෑ ය. එහෙත් ගම්පෙරළිය ලියැවී ඇත්තේ බ්‍රිතානීන්ගේ ආර්ථික හා සංස්කෘතික ආක්‍රමණයට කිසි ම විරුද්ධත්වයක් ගමෙන් (රටෙන්) පැන නො නැගුණු විලසට ය. වෙනත් වචනවලින්

© Prof. Nalin De Silva

කියන්නේ නම් මේ ආර්ථික හා සංස්කෘතික ආක්‍රමණය පිළිගැනීමට ගම සූදානමින් සිටියේ ය යන හැඟීමක් ගම්පෙරළිය කෘතිය කියැවීමෙන් ලැබෙයි. එමෙන් ම ගමෙහි ප්‍රභූන්ගේ සිදුවන වෙනස්කම් සිදුවිය යුතු ව තිබූ දේ බවත් ඒ ඊනියා යථාර්ථයක් ය යන අදහසත් ගම්පෙරළිය කියැවීමෙන් පාඨකයාට ලැබෙයි. මේ මාර්ටින් වික්‍රමසිංහ මහතා ජනප්‍රිය මාක්ස්වාදයෙන් ලබාගත් අදහස් විය හැකි ය. මාක්ස්වාදයට අනුව ගම වෙනස් විය යුතු ආකාරයට නන්දා පියල් ආදීහු වෙනස් වෙති.

ගම් පෙරළිය පිළිබඳ ව ඉහත සඳහන් කෙටි විවේචනයෙන් පසු අපි අපේ තේමාවට නැවතත් යමු. අප මෙහි දී සාකච්ඡා කරන්නේ වියුක්ත හා සංයුක්ත චරිත ය. මාර්ටින් වික්‍රමසිංහ මහතා තමා විසින් කියවන ලද පොත්පත් ඇසුරෙන් සාහිත්‍යයෙහි වියුක්ත චරිත යනු මොනවා දැයි හඳුනාගෙන තිබූ බව පැහැදිලි ය. එහෙත් ඉන් අදහස් වන්නේ වියුක්තය යනු කුමක් දැයි ඒ මහතා දැන සිටි බව නො වෙයි.

ගම්පෙරළියෙන් දැක්වෙන්නේ ලංකාවේ දකුණු පළාතේ ඕනෑ ම ගමක් මිස එක් නිශ්චිත ගමක් නො වෙයි. ඇතැම් පාඨකයන් ගම්පෙරළියෙහි ගම ලෙස එවකට තිබූ කොග්ගල හඳුනාගන්නවා විය හැකි ය. එහෙත් මාර්ටින් වික්‍රමසිංහ මහතා ගම්පෙරළිය ලියා ඇත්තේ ඉන් කොග්ගල නම් නිශ්චිත ගම නිරූපණය වන ආකාරයෙන් නො වෙයි. මෙහි දී පැහැදිලි කළ යුතු කරුණක් වෙයි. ඒ ගම්පෙරළියෙන් දකුණු පළාතේ ඕනෑ ම ගමක් දැක්වෙන්නේ ය, නිරූපණය වන්නේ ය ආදී ප්‍රකාශවලින් කියැවෙන්නේ මාර්ටින් වික්‍රමසිංහ මහතා මවාගත් ගමක් මිස ලංකාවේ තිබූ ගමක් නො වන බව ය. තමා දත් ජනප්‍රිය මාක්ස්වාදය ඇසුරෙන් ගම වෙනස් වන්නේ මෙසේ ය යන අදහස ඇති ව වික්‍රමසිංහ මහතා ගමක විසූ ප්‍රභූ පවුලක් පිළිබඳ කතාවක් අපට කියයි.

කෙටිකතා හා නවකතා පිළිබඳ වසර හැත්තෑ පහකට පමණ පෙර මාර්ටින් වික්‍රමසිංහ මහතා හා ඩබ්. ඒ. සිල්වා මහතා අතර කෙරුණු විවාදයක් මේ දිනවල දිවයින පුවත්පතෙහි බ්‍රහස්පතින්දා අතිරේකයෙහි නැවත පළ වෙයි. එහි දී සාකච්ඡා වන්නේ බටහිර නවකතාව ශාඛා දෙකකට බෙදිය හැකි ද, නැත්නම් තුනකට බෙදිය හැකි ද යන්න ය. ඩබ්. ඒ. සිල්වා මහතා බටහිර නවකතාවෙහි ශාඛා තුනක් ඇති බව කියා ඇති අතර මාර්ටින් වික්‍රමසිංහ මහතා ශාඛා දෙකක් පමණක් ඇති බව කියා ඇත. මෙතෙක් දිවයින පුවත්පතෙහි පළ වූ ලිපිවලින් නම් පෙනී යන්නේ මේ විවාදයෙහි දී දෙදෙනා ම කර ඇත්තේ බටහිර ලේඛකයන් උපුටා දැක්වීම බව ය. පැහැදිලි ව ම දෙදෙනා ම බටහිර ලේඛකයන්ගේ පොතපත කියවා යම් නිගමනවලට බැස ඇත.

වික්‍රමසිංහ මහතා සඳහන් කරන බටහිර ලේඛකයන්ට අනුව නවකතාවෙහි ස්වාභාවිකවාදී හෝ තාත්ත්විකවාදී (realistic)- හා අද්භූතවාදී (romantic)- යනුවෙන් ශාඛා දෙකක් වෙයි. ඩබ්. ඒ. සිල්වා මහතා උපුටා දක්වන බටහිර ලේඛකයන්ට අනුව එහි මනංකල්පිතවාදී (idealistic)- යනුවෙන් තවත් ශාඛාවක් වෙයි. වික්‍රමසිංහ මහතා උපුටා දක්වන ලේඛකයන් කියන්නේ මනංකල්පිතවාදය ද තාත්විකවාදී නවකතාවෙහි ඇති බව ය. ඩබ්. ඒ. සිල්වා මහතාට අනුව (එනම්, ඒ මහතා උපුටා දක්වා ඇති ලේඛකයන්ට අනුව) මනංකල්පිතවාදය තාත්ත්විකවාදයෙහි ඇතුළත් කිරමට නොහැකි ය. ඩබ්. ඒ. සිල්වා මහතා ඊනියා තාත්ත්විකවාදී නවකතා නො ලීවේ ය. වික්‍රමසිංහ මහතා තැත් කළේ ඊනියා තාත්ත්විකවාදී නවකතා ලිවීමට ය.

මේ දෙදෙනාට ම ගුරු වූ බටහිරයන් අමතක කළ කරුණ වූයේ ඕනෑ ම නවකතාවක් යනු නිර්මාණයක් බව ය. එපමණක් නො ව අප ප්‍රත්‍යක්ෂ වශයෙන් ගන්නා දේ ද අපේ නිර්මාණ වෙයි. අප එලෙස නිර්මාණ කරන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබඳ අපේ අවිද්‍යාව හේතු කොටගෙන ය. අප විසින් ඉදිරිපත් කෙර ඇති නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයෙහි මූලික අදහසක් වනුයේ ඒ කරුණ ය. එබැවින් ඊනියා තාත්ත්විකවාදී යනුවෙන් නවකතා නැත. තාත්ත්විකවාදී යැයි කියැවෙන සෑම නවකතාවක් ම මනසෙන් කරන නිර්මාණයකි. එමෙන් ම අද්භූතවාදී යැයි කියන නවකතා ද මනසේ නිර්මාණ වෙයි. එපමණක් නො ව අද ප්‍රචලිත ව ඇති අධියථාර්ථවාදී ආදී විවිධ ආකාරයේ නවකතා ද මනසේ නිර්මාණ පමණක් වෙයි.

අප මනසින් නිර්මාණය කරන ඕනෑ ම දෙයක අප විසින් දැනට නිර්මාණය කරනු ලැබ ඇති දෑ අඩංගු වෙයි. මල යන්න අප විසින් නිර්මාණය කෙර ඇති සංකල්පයකි. අපි ගස් වැල්වල මල් දකිමු. බඹරකු එහි කුමක් දකින්නේ දැ යි

අපි නො දනිමු. එහෙත් අපි බඹරා මලට ඇදෙන්නේ යැයි කියමු. මල පමණක් නො ව ගස් වැල් ද, බඹරා ද අපේ නිර්මාණ වෙයි. අපි දිව්‍යලෝකයෙහි ඇතැයි කියන පරසතු මල් ගැන කතා කරමු. පරසතු මලක් දැක නැති වුව ද අපට ඒ යම් මලක් ලෙස මනසෙහි නිර්මාණය කරගත හැකි ය. අප එලෙස පරසතු මල් නිර්මාණය කරන්නේ අප දැනටමත් නිර්මාණය කර ඇති මෙලොව ඇතැ යි කියන මල් ආශ්‍රයෙනි. පරසතු මලක් නො ව කිසි දිනෙක ඇපල් මලක් දැක නැති තරුණයෙක් "ඔබ ඇපල් මලක් වාගේ" යන ගීතය අසා තම මනසෙහි ඇපල් මලක් නිර්මාණය කරගනියි. ඔහු ඒ ඇපල් මල නිර්මාණය කරගනු ඇත්තේ තමා මේ වන විටත් නිර්මාණය කර ඇති අනෙක් මල් ආශ්‍රයෙන් හා ඇතැම් විට තමන් දන්නා යුවතියකගේ මුහුණ ඇසුරෙන් විය හැකි ය. (ඒ මුහුණ ද ඔහුගේ නිර්මාණයකි.) එහි දී ඔබ ඇපල් මලක් වාගේ යන්න වෙනුවට අපට ඇපල් මල ඔබ වාගේ යන ආකාරයේ ප්‍රකාශයක් කළ හැකි ය. අපේ නිර්මාණ එබඳු ය. ඩබ්. ඒ. සිල්වා මහතා හා මාර්ටින් වික්‍රමසිංහ මහතා අතර වී ඇති විවාදය එවැනි නිර්මාණ පිළිබඳ ව වෙයි.

සටහන

මාර්ටින් වික්‍රමසිංහ මහතා ද්වන්ද්වාත්මක භෞතිකවාදය යන්න යොදාගත් බව මා කලින් ලිපියක සඳහන් කර ඇත. ඒ වැරදි ය. ඒ බව මා මිත්‍ර පාඨක මහතකු දන්වා ඇත. ඒ වරද පෙන්වා දීම පිළිබඳව ඒ මහතාට කෘතඥ වන අතර ඒ තර්ක භෞතිකවාදය යනුවෙන් නිවැරදි විය යුතු ය. අපෝහක භෞතිකවාදය (Dialectical Materialism)- යන්න වෙනුවට පසු කලෙක මාක්ස්වාදීන් බොහෝවිට ද්වන්ද්වාත්මක භෞතිකවාදය යොදාගත් අතර මාර්ටින් වික්‍රමසිංහ මහතා යොදාගත්තේ තර්ක භෞතිකවාදය යන්න ය. ද්වන්ද්වාත්මක යන වචනය මෙන් ම තර්ක යන වචනය ද අපෝහක යන්න සඳහා යොදා ගැනීම වැරැදි ය. තර්කයක් යොදා ගැනෙන්නේ න්‍යායක (Logic)- ය. අපෝහකය යනු තර්කයක් නො ව න්‍යායකි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva